WWW.ASKNETWORK.NET

Sinhala

අධිකාරිය ඇති අය වෙනුවෙන් වචනය තුළින් යාච්ඤා කරන්න

සියල්ලටම ප්‍රථමයෙන්, සෑම දෙනා වෙනුවෙන් අයැදුම් ද යාච්ඤා ද ඉල්ලීම් ද ස්තුති දීම් ද ඔප්පු කළ යුතු බව මගේ අවවාදය යි. භක්තියෙන් හා ගෞරවයෙන් යුක්ත ව, සාමකාමී තැන්පත් ජීවිතයක් අපට ගත කළ හැකි වන පිණිස, රජවරුන් හා උසස් තනතුරු දරන සියල්ලන් උදෙසා ද යාච්ඤා කළ යුතු ය. මෙය මිදුම්කාර දෙවියන්වහන්සේ ඉදිරියෙහි යහපත් ය. ප්‍රසන්න ය. සියලු මනුෂ්‍යයන්ගේ මිදීමත්, ඔවුන් සත්‍යය දැනගැනීමත් දෙවියන්වහන්සේගේ කැමැත්ත ය. **1 තිමෝති 2:1-4**

මෙම බයිබල් කොටස ඔබට යාච්ඤා කරන්නේ කෙසේද, යාච්ඤා කළ යුත්තේ කවුරුන් වෙනුවෙන්ද, අප යාච්ඤා කරන්නේ ඇයි සහ අප යාච්ඤා කළ යුත්තේ කුමක් සඳහාද යන්න ඔබට කියා දෙයි.

යාච්ඤා කරන්නේ කෙසේද: අයැදුම් ද යාච්ඤා ද ඉල්ලීම් ද ස්තුති දීම් ද සමඟ.

ඔබ විවිධ ආකාරයේ යාච්ඤාවන් ඉගෙන ගෙන ශුද්ධාත්මයාණන්වහන්සේට ඔබට මඟපෙන්වන්නට ඉඩ හැරිය යුතුයි. මෙහි සියළු ආකාරයේ යාච්ඤාවන් බහු වචනයෙන් බව සැළකිය යුතුයි.එයින් බොහෝ යාච්ඤාවන් සළකුණු කරයි.

යාච්ඤා කළ යුත්තේ කවුරුන් වෙනුවෙන්ද: සෑම දෙනා වෙනුවෙන්, රජවරුන් හා උසස් තනතුරු දරන සියල්ලන් උදෙසා. අප යාච්ඤා කරන්නේ ඇයි: සාමකාමී තැන්පත් ජීවිතයක් අපට ගතකළහැකි වන පිණිස

යුද්ධයේ සහ/හෝ හිංසා පීඩාවල ජීවත් වීමට වඩා

අප යාච්ඤා කළ යුත්තේ කුමක් සඳහාද: 1 තිමෝති 2:4 “සියලු මනුෂ්‍යයන්ගේ මිදීමත්, ඔවුන් සත්‍යය දැනගැනීමත් දෙවියන්වහන්සේගේ කැමැත්තය.”

ගැළවීම යනු පුළුල් වචනයකි. එය ඉෂ්ටකරගන්නට ජීවිත කාලයම ගතවන්නේය. (පිලිප්පි 2:12). යේසුස්වහන්සේ අපගේ ගැළවුම්කරුවාණන් ලෙස පිළිගන්නා පළමු අත්දැකීම, දෙවියන්වහන්සේ දැනගැනීමෙන් අපව වළකන බාධකය වන පාපය ඉවත් කිරීමකි. අපගේ ආත්මය නැවත ඉපදී අප දෙවියන්වහන්සේට සහ ආත්මික දේ වලට ජීවත්ව සිටින්නේය. (යොහන් 3:5-8)

ගැළවීම - ගැළවීම සඳහා ඇති නව ගිවිසුමේ ග්‍රීක වචනය නම් සෝසෝ ය. එහි අර්ථය ගළවනු ලැබූ යන්නයි.ලුක් 7 සහ 8 ගැළවීමේ විවිධ අංශ පෙන්වයි: පාපයට සමාව, ශාරීරික ආරක්ෂාව, මිදීම, ශාරීරික සුවකිරීම් සහ ආශ්චර්යමත් බලය.
අධිකාරිය ඇත්තන්ට මෙම ගැළවීමේ පූර්ණත්වය අත්දකින ලෙසට අප ඔවුන් වෙනුවෙන් යාච්ඤා කළ යුතුය.

අප යාච්ඤා කළ යුත්තේ කුමක් සඳහාද: 1 තිමෝති 2:4 තව දුරටත්, “සියලු මනුෂ්‍යයන්ගේ මිදීමත්, ඔවුන් සත්‍යය දැනගැනීමත්.”

අපගේ නැවත උත්පාදනය වූ ආත්මය තුළින් අපට දෙවියන් වහන්සේ පිළිබඳ අත්දැකීම් සහිත ගැලවීමේ දැනුමක් සහ ලෝකයේ ආකාරයට වඩා වෙනස් වන දේව රාජ්‍යය පාලනය කරන උන්වහන්සේගේ සත්‍යය තිබිය යුතුය.

යාච්ඤාවට පිළිතුරු ලැබෙන බවට සහතිකයක් තිබේ.

1 තිමෝති 2:3 “මෙය මිදුම්කාර දෙවියන්වහන්සේ ඉදිරියෙහි යහපත් ය. ප්‍රසන්න ය.”
2වන සහ 4වන පද දෙකේම සඳහන් කරන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්ත පිළිබඳය: සියළු මනුෂ්‍යයන් ගැළවීම ලබන්නටත්, සත්‍යය දැනගැනීමටත්, අපි සියලු භක්තියෙන් හා විනීතභාවයෙන් නිහඬ හා සාමකාමී ජීවිත ගත කිරීමත් දෙවියන්වහන්සේගේ කැමැත්ත ය. සියළු මනුෂ්‍යයන් ගැළවීම ලබන්නට සහ සියලු භක්තියෙන් හා විනීතභාවයෙන් නිහඬ හා සාමකාමී ජීවිත ගතකිරීමත් දෙවියන්වහන්සේට යහපත් සහ පිළිගත හැකි වන්නෙකි.පිළිගත හැකි යන්නෙන් අදහස් කරන්නේ යාච්ඤාව යහපත්, දේවභක්තික සහ උන්වහන්සේට පිළිගත හැකි බවයි, මන්ද එය උන්වහන්සේගෙන් පැමිණෙන බැවිනි; එමනිසා උන්වහන්සේ එයට පිළිතුරු දෙන සේක. මෙම යාච්ඤාවන් අපට සියලු භක්තියෙන් හා විනීතභාවයෙන් නිහඬ හා සාමකාමී ජීවිත ගතකරන්නට යහපත් බලපෑමක් ඇති කරන බව සැළකිය යුතුයි.

(මෙම හිස් පිටුව ඔබේ රටේ රාජ්‍ය නායකයන්ගේ නම් ලැයිස්තුගත කිරීම සඳහා භාවිතා කරන්න.)